# කතුවැකිය...

03 වෙනි පිටුවෙන්.....

මේ නියම දැනුවත්ව කඩ කළ ප්‍රථම නායකයා ජේ.ආර්. ජයවර්ධනය. ඔහු දන්නෝ බුදුන් බිහි වූ යුගය විකාශනය වී අමරදේව, සුනිල් ශාන්ත, ආනන්ද සමරකෝන් වැන්නන් දේශජ සංස්කෘතියට අදාළ අපූරු ගීතාවලියක් බිහි කොට තිබිය දී ය ඔහු ගීතය තෝරා ගන්නේ.

වික්‍රමසිංහ ඊට සමගාමීව ජනාධිපති තනතුරේ සිටම අපට 'වදකහ සුදිය' බොන්නට යෝජනා කරයි.

රට ව්‍යසන ගාලක පැටලී සිටී. කැනඩාවේ ඔටාවා නුවර දී ශ්‍රී ලාංකික දරු පවුලක්ම තවත් ශ්‍රී ලාංකික ඝාතක තරුණයකු විසින් ශ්‍රී ලාංකික ක්‍රමයට කපා කොටා මරා දමා තිබේ. වසර තිහක ඉතිහාසයේ මෙවැනි සහාසික අපරාධයක් සිදුව නැති බව කියැවේ. මෙයින් කම්පාවට පත්ව ඇත්තේ ශ්‍රී ලාංකිකයන් පමණක් නොව සමස්ත කැනඩාවමය. කැනඩා අග්‍රාමාත්‍ය ජස්ටින් ටෘඩෝ එවැන්නක් නැවත කැනඩා භූමිය තුළ නොවීමට අප වගබලා ගනිමු යයි හැඬුම් ස්වරයෙන් පවසද්දී ඒ වින්දිතයන් හා ඝාතකයන් තවමත් පුරවැසිකම දරණ රටේ නායකයා ප්‍රකාශයක්වත් නිකුත් නොකොට මහා ක්‍රිකට් තරගයේ වදකහ සුදිය ගයා නටයි.

**සංස්කාරක**

# කැනඩා මහකොමසාරිස් - අනුර කුමාර අතර හමුවක්



*(ආරියරත්න රණබාහු)*

ශ්‍රී ලංකාවේ කැනඩා මහකොමසාරිස් එරික් වොල්ෂ් (Eric Walsh) මහතා ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක මහතාව පැලවත්ත ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ මූලස්ථානයේ දී (13) පෙරවරුවේ හමුවිය.

මෙම හමුව සඳහා ශ්‍රී ලංකාවේ කැනඩා මහකොමසාරිස් කාර්යාලයේ දෙවැනි ලේකම් (දේශපාලන) පැට්‍රික් පිකරින් (Patrick Pickering) සහ ජාතික ජන බලවේගය ජාතික විධායක සභික විජිත හේරත් යන මහත්වරුද එක්ව සිටියහ.

මේ වන විට ශ්‍රී ලංකාවේ පවතින සමාජ ආර්ථික හා දේශපාලන තත්වය පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡාවට බඳුන් වූ අතර ජාතික සමගිය ගොඩනැගීම වෙනුවෙන් ජාතික ජන බලවේගයේ සැලසුම් පිළිබඳ ව ද දෙපාර්ශ්වය අතර අදහස් හුවමාරු විය. කැනඩාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයින් හමුවීම සඳහා අනුර කුමාර දිසානායක මහතා ඉදිරියේ දී කැනඩාවේ සංචාරයක නිරත වන බව ද මෙහිදී කොමසාරිස්වරයා ට දැනුම් දුන් අතර ඒ සඳහා ඔහු දිසානායක මහතාට සුබ පැතීය.

# අසෝක තිලකරත්න හඬ නිහඬ වෙයි



*(ආරියරත්න රණබාහු )*

ප්‍රවීණ නිවේදකයකු මෙන්ම ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියෙකු වූ අසෝක තිලකරත්න මහතා අභාවප්‍රාප්ත විය.

මියයනවිට 82 වියේ පසු වූ ඒ මහතා කලක් අසනීප තත්ත්වයෙන් පසු වූ අතර කළුබෝවිල මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියේය

හෙතෙම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හිටපු සභාපතිවරයකු වූ රිජ්වේ තිලකරත්න මහතාගේ එකම සොහොයුරා ද වේ.

ගුවන් විදුලියේ ස්වර්ණමය යුගය ලෙස රිජ්වේ තිලකරත්න මහතාගේ පාලන කාලය හැඳින්වේ

අසෝක තිලකරත්න මහතා ලක්හඬ ගුවන් විදුලිය ආරම්භක සාමාජිකයෙකි

**MARRIAGE PROPOSALS**

Buddhist parents seeking well educated son, living in Canada for their daughter born Nov 1995, 5'3" who graduated from reputed University in Toronto and employed in well established Canadian bank in a senior position.

Please reply with family details to:
**proposalscad@gmail.com**